UNIVERSITY OF PERADENIYA
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION
දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

තෙවන වසර ශාස්ත්‍රවේදී උපාධි පරීක්ෂණය (බාහිර - නව නිර්දේශය)
මාර්තු 2022

THIRD YEAR (300 LEVEL) EXAMINATION IN BACHELOR OF ARTS
(EXTERNAL NEW SYLLABUS) MARCH 2022

**BSCE 301**: ආසියාවේ බෞද්ධ සංස්කෘතිය

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
(මෙම පත්‍රයට ඇතුළත් ප්‍රශ්න සංඛ්‍යාව 10 කි.) (කාලය - පැය තුනයි)

---

1. බුදුසමය භාරතයේ විවිධ ප්‍රදේශවල ව්‍යාප්ත වීමට බුදුන් වහන්සේ සහ ශ්‍රාවකයන් වහන්සේලාගේ ජනපද චාරිකාව ඉවහල් වූ අයුරු පිරික්සන්න.

2. පළමු සහ දෙවන ධර්මසංගායනා බුදුසමයේ පශ්චාත් කාලීන ඉතිහාසය කෙරෙහි බලපෑ අයුරු විස්තර කරන්න.

3. අශෝක රාජ්‍ය සමයේ ඇති වූ බෞද්ධ සංස්කෘතික පුනරුදයේ සුවිශේෂත්වය පැහැදිලි කරන්න.

4. කණිෂ්ක අධිරාජයා යටතේ වයඹ දිග ඉන්දියාවේ ඇති වූ බෞද්ධ සංස්කෘතික පුනරුදය විස්තර කරන්න.

5. නාලන්දා විශ්වවිද්‍යාලය ආසියාවේ බෞද්ධ සංස්කෘතියේ කේන්ද්‍රස්ථානයක් වශයෙන් ක්‍රියාත්මක වූ අයුරු පිරික්සන්න.

6. බෞද්ධ සංස්කෘතිය මධ්‍ය ආසියාවේ ව්‍යාප්තව පැවති බවට පවතින සාධක පරීක්ෂා කරන්න.

අනෙක් පිටුවට ...

7. චීනයේ බුදුසමය ප්‍රතිෂ්ඨාපිත වීම පිළිබඳ ඇති ඓතිහාසික තොරතුරු පිරික්සන්න.

8. "තිබ්බත දේශයේ බුදුසමය" පිළිබඳ විස්තරයක් සපයන්න.

9. මියන්මාර් දේශයේ ජන ජීවිතය බෞද්ධ සංස්කෘතියෙන් පෝෂණය වූ අයුරු විස්තර කරන්න.

10. "බුදුසමය සියවස් ගණනාවක් මුලුල්ලේ ආසියාවේ රටවල් අතර අන්තර් සම්බන්ධතාවල දී ප්‍රධාන විෂය බවට පත්ව තිබුණි." නිදසුන් දක්වමින් සාකච්ඡා කරන්න.

==========